# මැතිවරණ කොමිෂන් සභාවේ විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුර සඳහා විවෘත බඳවා ගැනීම 2025.

මැතිවරණ කොමිෂන් සභාවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. බඳවාගැනීමේ ක්‍රමය

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

## 02. අවශ්‍ය සුදුසුකම්

I. අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

II. පළපුරුද්ද

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයකු වශයෙන් වසර තුන (03) කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, දිනය හා නිල මුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය)

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර තුන (03) කට නොඅඩු, පහත දැක්වෙන කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම.

අ) නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කර තිබීම.
ආ) ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු.
ඇ) අදාළ අණපනත් සම්බන්ධව නෛතික කටයුතු.
ඈ) පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු.
ඉ) විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු කර තිබීම.

(මෙම කරුණු ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නිකුත් කළ සහතිකයක් මඟින් හා ලේඛන මඟින් සනාථ කළ යුතුය)

III. කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV. වෙනත් සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**03.** සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iii. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂා/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද පත්වීම යටත් වේ.

v. ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**04.** වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**05.** වැටුප් පරිමාණය

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය, රු.47,615-10x1,335-8x1,630-17x2,170-110,895/- (SL-1-2016) වේ.

**06.** යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | |
| | i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | 25 |
| | ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලොමාවක් | 20 | |
| | iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද | | |
| | • පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය. | 15 | |
| | • දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | • පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | • සාමාන්‍ය සමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |

| | | | |
|---|---|---|---|
| | iv) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය<br><br>සටහන I : නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ.<br><br>සටහන II : ඉහළම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 10<br>05 | |
| 02. | අතිරේක වෘත්තීය පළපුරුද්ද<br><br>අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 2(ii) හි සඳහන් ස්වභාවයේම අතිරේක පළපුරුද්ද (මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන වසර 03 ක පළපුරුද්ද හැර)<br><br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම : ලකුණු 25<br>- මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු කාලයකට : ලකුණු 03<br><br>• අවුරුදු 15කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද මෙම සේවා කාලය (අයදුම්කරු වෙනුවෙන් නිකුත් කරනු ලබන සහතිකය තුළම සඳහන් කළ යුතුය) නීතිඥවරයෙකුගෙන් හෝ අධිකරණ සේවයේ නිලධරයකුගෙන් හෝ ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.<br><br>• රජයේ හෝ පෞද්ගලික අංශයේ නිලධරයකු ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තේ නීතිමය තනතුරක සේවය කරන කාලය තුළ බව අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන්ගේ සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය.<br><br>• මැතිවරණ නීතිය පිළිබඳව හා ඊට අදාළව අධිකරණ කටයුතු පිළිබඳ පළපුරුද්ද ලබා ඇති අයදුම්කරුවන් සඳහා වසරකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 10 (සහතික මගින් සනාථ කළ යුතුය.) | 25<br><br><br><br><br><br>10 | 35 |
| 03. | තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම<br>i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයන් ලෙස හදාරා තිබීම.<br><br>ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක්.<br><br>iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්. | 10<br><br><br>08<br><br><br>05 | 10 |

| | | | |
|---|---|---|---|
| | iv) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් පුහුණු/ වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/ පුහුණු වැඩ සටහන්වලට සහභාගී වී ලබාගත් සහතික පත්‍ර (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.)<br>සටහන : ඉහළම සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 04 | |
| 04. | භාෂා හැකියාව<br>• නීති අධ්‍යාපනය ලද සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය හැර සෙසු භාෂා මාධ්‍ය දෙකට ප්‍රවීණතාව අනුව ලකුණු ලබාදෙනු ලැබේ. | 7.5 බැගින් | 15 |
| 05. | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>i) සාමාන්‍ය දැනීම හා බුද්ධිය<br>ii) නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවීණතා පිළිබඳ දැනුම<br>iii) පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය | 05<br>05<br>05 | 15 |
| | එකතුව | | 100 |

<u>සටහන -</u> යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතික පත්‍රවලට අදාළ කාලසීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරිම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

**07.** අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචිකිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
ii. වලගු විදේශ ගමන් බලපත්‍රය.

**08.** **අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය.**

i. අයදුම්පත් 2025.03.14 වැනි දිනට හෝ ඊට ප්‍රථම "ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළයුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම ගැසට් නිවේදනය අවසානයට දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් සකස් කර මුල් පිටුව අංක 01 සිට අංක 04 දක්වාත් දෙවැනි පිටුව අංක 05 සිට 10 දක්වාත් තෙවැනි පිටුව අංක 11 සිට අංක 12 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

iii. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සමාදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු.47,615/-ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

vi. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම.**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය මැතිවරණ කොමිෂන් සභාව සතුවේ.

11. මෙම පුවත්පත් නිවේදනය සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

12. මෙම නිවේදනය සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

**මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,**

**හේ.මු.කි.දි.හේරත්,**
**ලේකම්,**
**මැතිවරණ කොමිෂන් සභාව.**
2025.02.07